**ශ්‍රී ලංකා ජීවිතාරක්ෂක සංගමය - 2024**

**--------------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 වියාචනය කල මතය**

ශ්‍රී ලංකා ජීවිතාරක්ෂක සංගමයේ (“ සංගමය”) 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය, සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්ති වලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහාවූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමග සංයෝජිතව කියවිය යුතු 2018 අංක19 දරන ජාතික විගණන පනතේ සහ 1993 අංක 47 දරන ක්‍රීඩා (සංශෝධන) පනතේ 9වන වගන්තියෙන් සංශෝධිත 1973 අංක 25 දරන ක්‍රීඩා පනතේ 21 (අ) වගන්තියේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කල යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

සංගමයේ මූල්‍ය ප්‍රකාශන පිලිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි. මෙම වාර්තාවේ 1.5 ඡේදයේ විස්තර කරනු ලබන කරුණුවල වැදගත්කම හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්හන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මාහට නොහැකි විය.

**1.2 වියාචනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව, මම මතයක් ප්‍රකාශ නොකරමි.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව, මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ, ආදායම් ප්‍රකාශනයේ,හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශනයේ සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ ඇතුලත් ප්‍රමාණාත්මක අයිතම විකල්ප ක්‍රම මගින් තහවුරු කිරීමට හෝ සත්‍යාපනය කිරීමට මට නොහැකි විය.

මේ හේතුවෙන් ,මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය, සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සැකසෙන වටිනාකම් හෝ අයිතමයන්වල වාර්තාගත හෝ වාර්තා නොකළ වටිනාකම් හෝ ගනුදෙනු සම්බන්ධයෙන් කිසියම් ගැලපීමක් කිරීමට අවශ්‍ය දැයි මට නිශ්චය කිරීමට නොහැකි විය.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම**

මෙම මූල්‍ය ප්‍රකාශන සුළු හා මධ්‍ය-පරිමාණ අස්ථිත්වයන්, සඳහා ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූලව පිලියෙල කිරීම සත්‍ය හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිලියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිලියෙල කිරීමේදී, සංගමය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණ කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සංගමය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් සහ වෙනත් විකල්පයක් නොමැති විට මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සංගමයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සංගමයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සංගමයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිලියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිලිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන ය යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

ශ්‍රී ලංකා විගණන ප්‍රමිත වලට අනුකූලව සංගමයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණනය කර විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ වගකීම වේ. කෙසේවුවද, 1.5 ඡේදයේ විස්තර කර ඇති කරුණු හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීම සම්බන්ධයෙන්වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමණාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පෙර වර්ෂයට අදාළ රු. 2,549,690 ක ආදායම, සමාලෝචිත වර්ෂයේ ආදායම ලෙස ගණනය කර තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස සමාලෝචිත වර්ෂයේ ආදායම සමාන ප්‍රමාණයකින් වැඩියෙන් දක්වා තිබුණි. | 2023 වර්ෂයට අදාළ ආදායම 2024 වර්ෂයේ ආදායම ලෙස ගිණුම්ගත කර තිබුණි. | ගිණුම්කරණ දෝෂය නිවැරදි කිරීමටත්, ඉදිරියේදී මෙවැනි දෝෂ නැවත සිදු නොවීමටත් අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

### 1.5.2 අධිකාරි බලය නොලත් ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | කළමණාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සංගමයේ හිටපු ලේකම්වරයාගෙන් අයකර ගත යුතු රු. 4,230,690 ක මුදලක් මෙම වාර්තාවේ දින වන විටත් පියවීමකින් තොරව පැවතිණි. | පොලිස් විමර්ශන මේ වන විට සිදු වෙමින් පවතී. | අදාළ පාර්ශවයෙන් ලැබිය යුතු මුදල් තවදුරටත් ප්‍රමාද නොකර අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

### 1.5.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොමැතිවීම

| විෂය | මුදල (රු .) | නොසැපයූ විගණන සාක්ෂි | කළමණාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| වියදම් | 31,755,205 | ගෙවීම් සඳහා අදාළ වවුචර් 17 ක් සහ බිල්පත්, ඉන්වොයිස් හා අනෙකුත් උපකාරක ලේඛන වැනි මූලාශ්‍ර ලේඛන. | අදාළ වවුචර් සහ ඒවාට අදාළ උපකාරක ලේඛනවල පිටපත් නොමැතිව පෙර පරිපාලනය විසින් ගෙවීම් සිදු කර තිබුණි. | සියලු වවුචර් සහ ලේඛනමය සාක්ෂි විගණනය සඳහා ඉදිරිපත් කළ යුතු අතර, ඉදිරියේදී මෙවැනි අඩුපාඩු හා අකාර්යක්ෂමතා ඇති නොවන ලෙස අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

## 1.6 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම | කළමණාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ ) 1973 අංක 25 දරන ක්‍රීඩා පනතේ V වන කොටසේ 40 වන වගන්තිය | සමාලෝචිත වර්ෂය තුළ ඉන්දියාවේ පැවැති ඉන්දු–ලංකා ජීවිතාරක්ෂක ශූරතාවයට ක්‍රීඩකයින් 24 දෙනෙකු සහ අනෙකුත් නිලධාරීන් 06 දෙනෙකු සහභාගී වී තිබුණි. එහෙත්, ඒ සඳහා ක්‍රීඩා අමාත්‍යවරයාගෙන් ලබාගත් අනුමැතිය විගණනය වෙත ඉදිරිපත් කිරීමට සංගමය අපොහොසත් වී තිබුණි. | විදේශ සංචාර සඳහා මූල්‍ය අවශ්‍යතා ඇති අවස්ථාවලදී ලිඛිතව දැනුම් දී තිබුණද, ඒ සම්බන්ධයෙන් කිසිදු ලිඛිත ප්‍රතිචාරයක් ලබාදී නොතිබුණි. | සංගමය විසින් අදාළ අනුමැතීන් තවදුරටත් ප්‍රමාද නොකර ඉදිරිපත් කළ යුතු අතර, ඉදිරියේදී මෙවැනි අඩුපාඩු හා අකාර්යක්ෂමතා ඇති නොවන ලෙස අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ආ )2024 මැයි 03 දිනැති අංක 2382/32 දරන අතිවිශේෂ ගැසට්පත්‍රය මගින් ප්‍රසිද්ධ කරන ලද 2024 අංක 01 දරන ක්‍රීඩා සංගම් නියෝගවල IIIකොටසේ 6(xxvii) | ක්‍රීඩා සමාජ, ආයතන, දිස්ත්‍රික් ක්‍රීඩා සංගම්, පළාත් ක්‍රීඩා සංගම් සහ සාමාජික සංවිධානවල නිලවරණ ඇතුළු සියලු ක්‍රියාකාරකම් පිළිබඳ විස්තර සංගමය විසින් වාර්ෂිකව ක්‍රීඩා සංවර්ධන අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ඉදිරිපත් කළ යුතු වුවද, මෙම වාර්තාවේ දින වන විටත් එම විස්තර ඉදිරිපත් කර නොතිබුණි. | මේ සම්බන්ධයෙන් අදාළ තොරතුරු සාමාජික සමාජ විසින් මෙතෙක් අප වෙත ලබාදී නොමැත. | සංගමය විසින් අදාළ විස්තර තවදුරටත් ප්‍රමාද නොකර ඉදිරිපත් කළ යුතු අතර, ඉදිරියේදී මෙවැනි අඩුපාඩු හා අකාර්යක්ෂමතා ඇති නොවන ලෙස අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඇ) ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් 2022 මැයි 31 දින නිකුත් කරන ලද අංක 2022/02 දරන අභ්‍යන්තර චක්‍ර ලේඛයේ 03 වන වගන්තිය | සෑම ගෙවීම් වවුචරයක්ම විධායක සහා සාමාජිකයන් දෙදෙනෙකු විසින් අනුමත කර සහතික කළ යුතු අතර, මුදල් ලබාගන්නා පුද්ගලයාගේ අත්සනද එම වවුචරයේ ඇතුළත් කළ යුතුය. එහෙත්, සමාලෝචිත වර්ෂය තුළ සිදු කරන ලද රු. 39,423,408 ක ගෙවීම් සම්බන්ධයෙන් සංගමය එසේ කටයුතු කිරීමට අපොහොසත් වී තිබුණි. ඒ අනුව, මෙම ගෙවීම් ප්‍රමාණවත් අධිකාරියකින් තොරව සිදු කර ඇති බව නිරීක්ෂණය විය. | සංගමය විසින් සිදු කරන ඕනෑම වියදමක් මාසික සභාවේ අනුමැතිය ලබාගෙන හෝ මාසිකව එකවර කරන ගෙවීමක් ලෙස සිදු කරන අවස්ථාවලදී පමණක් සිදු කරනු ලැබේ. | සංගමය අදාළ චක්‍රලේඛයට අනුකූලව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

සමාලෝචිත වර්ෂයේ සංගමයේ මෙහෙයුම් ප්‍රතිපලය රු. 3,777,587ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 5,158,711ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයේ රු. 1,381,124ක පිරිහීමක් නිරීක්ෂණය විය. ඉකුත් වර්ෂය හා සැසඳීමේදී අනෙකුත් මෙහෙයුම් ආදායම රු. 13,526,594 කින් අඩුවීම මෙම පිරිහීමට ප්‍රධාන හේතුව වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමණාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2024 දෙසැම්බර් 31 දිනට අයකර ගත යුතු මුළු ශේෂය රු. 9,053,290 ක් විය. ඉන් රු 431,260 ක මුදලක් වසර 05 කට වැඩි කාලයක්ද, රු. 102,300 ක මුදලක් වසර 02 කට වැඩි කාලයක්ද අයකර නොගෙන පැවතිණි. තවද, ටී-ෂර්ට් මිලදී ගැනීම සම්බන්ධයෙන් ගෙවිය යුතු රු. 260,000 ක මුදලක් වසර 04 කට වැඩි කාලයක් පුරා පියවා නොතිබුණි. | සාක්ෂි නොමැති වීම හේතුවෙන් එම මුදල් ප්‍රමාණ හඳුනා ගැනීමට වත්මන් නිලධාරීන්ට නොහැකි වී තිබුණි. | සංගමය විසින් ලැබිය යුතු සියලු මුදල් තවදුරටත් ප්‍රමාද නොකර අයකර ගැනීමටත්, ගෙවිය යුතු සියලු මුදල් නොපමාව පියවීමටත් කටයුතු කළ යුතුය. |

### 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමණාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2024 වර්ෂය තුළ විදේශ තරඟාවලි 03කට, දේශීය තරඟාවලි 07කට සහ අනෙකුත් ක්‍රියාකාරකම් 14කට සහභාගී වීමට සංගමය සැලසුම් කර තිබුණද, සමාලෝචිත වර්ෂය තුළ විදේශ තරඟාවලි 02කට පමණක් සංගමය සහභාගී වී තිබුණි. | මෙම තරඟාවලි සාමාජික සමාජවලින් එකතු කරන ලද මුදල් හා විවිධ ආයතනවලින් ලැබුණු දායක මුදල් මත පමණක් සංවිධානය කර තිබුණි. | සැලසුම් කළ පරිදි තරඟාවලි පැවැත්වීමට කටයුතු කළ යුතු අතර, සැලසුම් තාත්වික ලෙස සකස් කිරීම සඳහාද අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |